# චතාරික සමයේ සතරවන සතිය
# බදාදා

## පළමුවන කියැවීම

ඉසයියස් දිවැස්ප්‍රසාදීතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

ඉසයියස් 49: 8-15

### මම ඔබ මගින් සියලු මිනිසුන් හා ගිවිසුමක් ඇති කර ගන්නෙමි.

සමිඳාණෝ මෙසේ වදාළ සේක.
"සුදුසු කාලයේ දී මම නුඹට පිළිතුරු දී ගැලවීමේ දවසේ දී නුඹට උපකාර කරන්නෙමි. මම නුඹ ආරක්ෂා කර, නුඹ මගින් සියලු මිනිසුන් සමඟ ගිවිසුමක් කරන්නෙමි. දැනට පාළු වී ඇති නුඹේ දේශය නැවත උරුම කර ගන්නට මම නුඹට දෙන්නෙමි. හිරකරුවන්ට නිදහස් ව යන්න කියා ද අඳුරේ සිටින්නන්ට 'ආලෝකයට එන්න' කියා ද මම කියන්නෙමි. හැම මාර්ගයකදී ම ඔවුන්ට කෑම ලැබෙයි. ඔවුන් යන කවර මාවතක දී වුව ද පාළු වී ගිය කඳු මුදුන් පිට ඔවුන්ට ආහාර ඇති වේ. ඔවුන්ට පිපාස නොවන්නේ ය. ගිනි අව්වෙන් වත්, මරු කතරෙන් වත් ඔවුන්ට පීඩාවක් නොවන්නේය. මන්ද ඔවුන්ට අනුකම්පා කරන තැනැත් වහන්සේ ඔවුන්ට මඟ පෙන්වන සේක. දිය උල්පත් අසලින් ඔවුන් කැඳවා ගෙන යන සේක. මම කඳු හරහා මහා මාවත් සාදා මාගේ සෙනග ගමන් කරන පිණිස මාර්ගයක් සූදානම් කරන්නෙමි. මාගේ සෙනඟගෙන් සමහරෙක් දුර බැහැර සිට පැමිණෙති. සමහරෙක් උතුරෙන් හා බස්නාහිරින් ද සමහරෙක් සීන්වරුන්ගේ දේශයෙන් ද පැමිණෙති. සඟලෝ ගී ගයාවා! පොළොව ප්‍රීති වේවා! කඳු ප්‍රීතියෙන් පිනා යේවා!

මන්ද, සමිඳාණෝ සිය සෙනඟ සනසන සේක. දුක් විඳින සෙනඟට අනුකම්පා කරන සේක. එහෙත් ජෙරුසලම් වැසියෝ 'සමිඳාණෝ අප අත්හළ සේක. අප මතක නැති කළ සේකැ' යි කීහ. සමිඳාණෝ පිළිතුරු දෙමින් මෙසේ වදාළ සේක. 'මවකට හැකි ද, කුසේ දැරූ බිළිඳා අමතක කරන්න? හැකිද ඇට ඇගේම කිරි දරුවාට පෙම් නොකරන්න? මවක ඇගේ දරුවා අමතක කළත්, මම නම් කිසි දා නුඹ අමතක නොකරමි.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 145 : 8-9, 13b, 14, 17, 18

පිළිතුර: සමිඳාණෝ දයාවන්ත ය. අනුකම්පාවෙන් පූර්ණ ය.

ගීය:

සමිඳාණෝ දයාවන්ත ය. අනුකම්පාවෙන් පූර්ණ ය. වහා නොකිපෙන සුළු ය. තිර සර පෙමින් යුතුය.
සමිඳාණෝ සියල්ලන්ට කරුණාව පාන සේක. එතුමන්ගේ සුමුදු දයාව මවන ලද සියල්ලන් වෙත පැතිරෙයි.

සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක. තමන් කරන සියල්ලේ දී මෙත් සිත් වඩන සේක. වැටෙන දුබලුන් හට සමිඳාණෝ ආධාර කරන සේක. නැමී සිටින සියල්ලන් කෙළින් සිටුවන සේක.

සමිඳාණෝ සැම අතින් ම සාධාරණ ය. එතුමන්ගේ සියලු ක්‍රියා දයාන්විත ය. අයදින සියල්ලන්ට සමිඳාණෝ ළංව සිටින සේක. අවංක සිතින් යදින්නන්ට ආසන්න ව සිටින සේක.

## සාධුකාරය

"මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව, දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින් ය"යි ස්වාමින් වහන්සේ වදාරණ සේක.

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 5 :17–30

***පියාණන් වහන්සේ මළවුන් උත්ථාන කොට ජීවත් කරවන්නාක් මෙන් පුත්‍රයාණෝ ද තමන් අභිමත වූවන් ජීවත් කරන සේක.***

එහෙත් ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "මාගේ පියාණන් වහන්සේ නොනැවතී ම වැඩ කරන සේක. මමත් වැඩ කරමි"යි වදාළ සේක. මේ කරුණ නිසා ජුදෙව්වරු උන් වහන්සේ මරන්නට වඩ වඩා උත්සාහ දැරූහ. මන්ද, උන් වහන්සේ සබත කඩ කළා පමණක් නොව දෙවියන් වහන්සේ තමන්ගේම පියාණෝය' යි කියමින් තමාත් දෙවියන් වහන්සේට සමාන යයි ප්‍රකාශ කළ නිසාය.

ජේසුස් වහන්සේ ඔවුන්ට මෙසේ පිළිතුරු දුන් සේක. "ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. පුත්‍රයාණන්ට කිසිවක් තනි බලයෙන් කළ නොහැකි ය. ඔහුට කළ හැක්කේ පියාණන් වහන්සේ කරන බව තමන්ට පෙනෙන දේ පමණකි. උන් වහන්සේ යම් දෙයක් කරන සේක් ද, ඒ දෙය පුත්‍රයාණෝ ද එසේම කරන සේක. මන්ද පියාණන් වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රේම කරන බැවින් තමන් වහන්සේ කරන සියලු ක්‍රියා උන් වහන්සේට දක්වා වදාරණ සේක. තවද ඔබ මවිත කරවන සුළු මීටත් වඩා මහත් ක්‍රියා ද දක්වා වදාරණ සේක. පියාණන් වහන්සේ මළවුන් උත්ථාන කොට ජීවත් කරවන්නාක් මෙන් පුත්‍රයාණෝ ද තමන්ට අභිමත වූවන් ජීවත් කරවන සේක. සැබැවින්ම පියාණන් වහන්සේ කිසිවකු විනිශ්චය නොකරන සේක. සම්පූර්ණ විනිශ්චය පුත්‍රයාණන් හට පවරා ඇත. එසේ කළේ සියලු දෙනා පියාණන්ට මෙන් පුත්‍රයාණන්ට ද ගෞරව කරන පිණිස ය. පුත්‍රයාණන්ට ගෞරව නොකරන්නා පුත්‍රයාණන් එවා වදාළ පියාණන්ට ද ගෞරව නොකරන්නේය.

"ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. මාගේ වචනය අසා, මා එවා වදාළ තැනැන් වහනසේ අදහාගන්නාට සදාතන ජීවනය ඇත. ඔහු විනිශ්චයට නොපැමිණෙයි. ඔහු මරණයෙන් ජීවනයට පැමිණ සිටියි. ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. දේව පුත්‍රයාණන්ගේ හඬ මළවුන් හට ඇසෙන පැය පැමිණෙන්නේය. දැනටම පැමිණ ඇත. සවන් දෙන අය ජීවත් වෙති. පියාණන් වහන්සේට තමන් තුළම ජීවන දායක බලය තිබෙන්නාක් මෙන්ම පුත්‍රයාණන්ටත් තමන් තුළ ජීවනදායකක බලය ඇතිව සිටින්නට උන් වහන්සේ වරය දුන් සේක. තවද උන් වහන්සේ මනුෂ්‍ය පුත්‍රයාණන් වන බැවින් විනිශ්චය කිරීමේ අධිකාරී බලය ද උන් වහන්සේට දෙවා වදාළ සේක. මේ ගැන මවිත නොවන්න. මන්ද සොහොන් ගත සියල්ලන්ට උන් වහන්සේගේ හඬ ඇසෙන පැය පැමිණෙන්නේ ය. එවිට

යහපත කළ අය සදාතන ජීවනය සඳහා උත්ථාන කරනු ලබති. අයහපත කළ අය විනිශ්චය සඳහා උත්ථාන කරනු ලබති.

“මාගේ තනි බලයෙන් මට කිසිත් කළ නොහැකිය. අණ ලත් පරිද්දෙන් ම මම විනිශ්චය කරමි. මාගේ විනිශ්චය සාධාරණ ය. මන්ද මාගේ අරමුණ මාගේ ම කැමැත්ත ඉටු කිරීම නොව මා එවා වදාළ උන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම ය.”

සුවිශේෂ වාක්‍යය එසේ ය.